# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 702 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 24/04/2024 පැය 2320

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනවලට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ ඒකකය.**

2024.03.11 වන දින පිටිගල හා අම්බලන්ගොඩ පොලිස් වසම්වලදී වෙඩිතබා පුද්ගලයින් 04 දෙනෙකු ඝාතනය කිරීම හා පුද්ගලයින් හයදෙනෙකුට තුවාල සිදුකිරීමේ සිද්ධින්ට අදාලව අවශ්‍යකර සිටි සැකකරුවෙකු 2024.04.20 වන දින රාත්‍රී කාලයේ පිටිගල පොලිස් වසමේ හොරන්ගල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ ඒකකයේ නිලධාරින් විසින් සැකකරු ගමන් කරමින් සිටි යතුරුපැදිය ද සමඟ අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශනය සඳහා පිටිගල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන හොරොවුපතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර ඔහුගේ මුල් පදිංචිය අම්බලන්ගොඩ තෙල්වත්ත ප්‍රදේශය බවට හා මොහු යුධ හමුදාවෙන් පලාගිය සෙබලෙකු බවටද අනාවරණය වී ඇත.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී සැකකරු සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සම්බන්ධ වී මනුෂ්‍ය ඝාතන, මත්ද්‍රව්‍ය ජාවාරම් හා මනුෂ්‍ය ඝාතන සැලසුම් සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර සැකකරු 2024.04.22 වන දින ඇල්පිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2024.04.25 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

පිටිගල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**